DOI: 10.31357/fhssmst.2001.00017

# උම්මග්ග ජාතකය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

(සාහිත්‍ය, දේශපාලනික හා සමාජීය පසුබිම)

ශිරාණි කහඳගේ මහත්මිය විසින් ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ 'උම්මග්ග ජාතකය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්' නැමැති නිබන්ධයේ සංශෝධන මා විසින් පරීක්ෂා කරන ලද බවත් එම නිබන්ධය ශාස්ත්‍රපති උපාධිය පිරිනැමීම සඳහා යෝග්‍ය බවත් මෙයින් ප්‍රකාශ කරමි.

මහාචාර්ය පුංචිබණ්ඩා ඒකනායක
සිංහල අධ්‍යයන අංශය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර.

2001. 04. 23

නිර්දේශ කොට ඉදිරිපත් කරමි.

17/05/2001

17-05-2001

# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
# පශ්චාද් උපාධි පීඨයේ ශාස්ත්‍රපති පරීක්ෂණය
# සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

| | | |
|---|---|---|
| නම | - | ශිරාණි කහඳගේ |
| ලේඛ්‍යාරූඪ අංකය | - | **GS\ HU 91\96** |
| විෂයය | - | සිංහල |
| අධ්‍යයන වර්ෂය | - | 96/97 I |
| | | 97/98 II |


සිංහල හා ජන සන්නිවේදන

අධ්‍යයනාංශය,


ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

ගංගොඩවිල,

නුගේගොඩ.

**බැති පුද**

වරද නිවරද කර
මේ සඳහා මට දුන්
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ
මහාචාර්ය එම්. ඩබ්ලිව් විමල් විජේරත්න
ගුරු පියාණන්ට
හද බැතින් පෙරටුව
මේ පොත පිදේ.




උම්මග්ග ජාතකයේ කථා සැලැස්ම

## උම්මග්ග ජාතකයේ කථා සැලැස්ම.

උම්මග්ග ජාතකයේ රචනා උපක්‍රමයක් ලෙස මූලික කථා ප්‍රවෘත්තිය වටා පරිවාර කථා සමූහයක් සම්බන්ධ කර කථා ප්‍රවෘත්තිය ප්‍රඥාවෙන් ආලෝකවත් කිරීමට කතුවරයා විසින් යොදා ගත් කථා ශෛලිය ගසෙහි ආකෘතියකින් පෙන්වා ඇත. මෙහි දී කථා ප්‍රවෘත්තිය ගසෙහි මූල සිට අග දක්වා එක්තරා ක්‍රමවේදයකට විහිදී යයි. ඒ අනුව ගසේ කඳ කොටසෙන් පෙන්වා ඇත්තේ උම්මග්ග ජාතකයේ එන මූලික කතා පුවත යි. එය පරිබණ්ඩ කාණ්ඩය හා මහා උම්මග්ග කාණ්ඩය වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට බෙදා ඇත. එයට සම්බන්ධ කර ඇති විහිදී ගිය අනෙකුත් අතු මගින් පෙන්වා ඇත්තේ ඊට සම්බන්ධිත පරිවාර කථා සමූහය යි. ඒ අනුව පරිබණ්ඩ කාණ්ඩයට කතා පුවත් තිහක් ඇතුළත් ව ඇත. මහා උම්මග්ග කාණ්ඩ කොටසට කතා පුවත අවසානයේ දී දිය රකුසු පැනය නම් කොටසක් සම්බන්ධ කර ඇත. මේ අනුව පරිවාර කථා තිහක් විවිධ පැන විසදුම් වශයෙන් ඊට ඇතුළත් ය. මෙහි මූල සිට අග දක්වා ඇති මූලික කතා පුවත හා එහි ඇති කථා සමූහය ගසෙහි ඇති අංක මගින් අනුපිළිවෙළට ඉදිරිපත් කර ඇත. එකී පරිවාර කථා ඇතුළත තවත් අතුරු කථා සම්බන්ධ කිරීමක් මෙහි දක්නට ලැබේ. මේ නිසා බෙදී ගිය අතු නැවතත් බෙදා වෙන් කිරීමෙන් එකී කතා පුවත් ද මෙ මගින් පෙන්වා ඇත. ඒවා අදාල අංකවල රෝම ඉලක්කම්වලින් පෙන්වා ඇත.

මේ අනුව ගසක ආකෘතියකින් පෙන්වා ඇති උම්මග්ග ජාතකයේ කථා ශෛලිය රැගත් පරිවාර කථා සමූහය හා මූලික කතා පුවතේ සැලැස්ම ඉහත දක්වා ඇති අතු අංක පිළිවෙළට නම් වශයෙන් වර්ගීකරණය කර ඇත.

A නිදාන කථාව.
*B* උම්මග්ග ජාතකය පරිබණ්ඩ කාණ්ඩය
*C* උම්මග්ග ජාතකය මහා කාණ්ඩය.

පරිබණ්ඩ කාණ්ඩය

1.මාංශ ප්‍රශ්නය.
2.ගොන් ප්‍රශ්නය.
3.ග්‍රන්ථි ප්‍රශ්නය.
4.සූත්‍ර ප්‍රශ්නය.
5.පුත්‍ර ප්‍රශ්නය.
6.ගෝළ කාළ ප්‍රශ්නය.
7.රථ ප්‍රශ්නය.
8.දණ්ඩක ප්‍රශ්නය
9.ශිර්ෂ ප්‍රශ්නය.
10.අහි ප්‍රශ්නය.
11.කුක්කුට ප්‍රශ්නය.
12.මණි ප්‍රශ්නය.
13.විජායන ප්‍රශ්නය.
14.පැසිබත් ප්‍රශ්නය.
15.වැලියොත් ප්‍රශ්නය.
16.තඩාග ප්‍රශ්නය.
17.උද්‍යාන ප්‍රශ්නය.

18.ගඳුහ ප්‍රශ්නය.
19.මණී ප්‍රශ්නය.
20.කකණ්ටක ප්‍රශ්නය.
21.සිරි කාලකණ්ණි ප්‍රශ්නය.
22.මෙණ්ඩක ප්‍රශ්නය.
23.සිරිමන්ද ප්‍රශ්නය.
24. 1.ජන්ත පථ ප්‍රශ්නය.
ii. ස්ත්‍රී ප්‍රශ්නය.
25.බජ්ජෝපත භූරි ප්‍රශ්නය.
26.දේවතා ප්‍රශ්නය
1. මාතෘ ප්‍රශ්නය.
11. බාල පරායත ප්‍රශ්නය.
111.අඹු සැමි ප්‍රශ්නය
1v. ශ්‍රමණ බ්‍රාහ්මණ ප්‍රශ්නය.
27. රහස්‍ය ප්‍රශ්නය.
28. දිය රකුසු ප්‍රශ්නය.

## උපකාර අනුස්මෘති

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය යටතේ ශාස්ත්‍රපති උපාධිය සඳහා සිංහල විෂය යටතේ මා විසින් ඉදිරිපත් කෙරෙන මේ ස්වාධීන අධ්‍යයන නිබන්ධයේ උපදේශකවරයා වශයෙන් කටයුතු කළේ එම විශ්වවිද්‍යාලයේ සිංහල හා ජන සන්නිවේදන අධ්‍යයනාංශයේ මහාචාර්ය එම් ඩබ්ලිව් විමල් විජේරත්න මහතා ය. මෙවන් පර්යේෂණයකට උම්මග්ග ජාතකය තෝතැන්නක් බව පළ කරන ලද්දේ ද එතුමා විසිනි. එහෙයින් එතුමාට ඒ වෙනුවෙන් මගේ කෘතඥතාව පළමුවෙන් ම පළ කර සිටිමි. තව ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨාධිපති ජ්‍යෙෂ්ඨ මහාචාර්‍ය තිස්ස කාරියවසම් මහතාටත් සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය රත්න විජේතුංග මහතාටත් මගේ කෘතඥතාව පළ කර සිටිමි. මෙම කර්තව්‍යයේ දී එතුමන්ලාගෙන් ලැබුණු මාර්ගෝපදේශකත්වය අතිශයින් ම පැසසුම් කටයුතු වේ. එමෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා හා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය ධම්මික දිසානායක මහතා ප්‍රමුඛ අනෙකුත් ගුරු භවතුන්ටත් මගේ ස්තූතිය පුද කරනු කැමැත්තෙමි.

තව ද මෙම නිබන්ධයේ පරිගණක කටයුතු කිරීමෙන් හා නන් අයුරින් උදව් උපකාර කළ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ සේවයේ නියුතු නිලධර මහත්ම මහත්මීන්ට ද මගේ හද බැඳි ප්‍රණාමය හිමි වේ.

## සංක්ෂේපණ

01 අ.ව - අමාවතුර

02 උ.ශ - උපදේශ ශතකය 2

03 උ.පි - උමන්දා පිවිසුම

04 උ.වි - උමන්දා විතිස

05 උ.ජා - උම්මග්ග ජාතකය

06 ක.සි - කව්සිළුමිණ

07 කා.ශේ - කාව්‍යශේඛරය

08 කු.ච - කුංකුම චන්දන

09 ගි.ස - ගිරා සංදේශය

10 ජා.ස - ජාතකට්ඨකථා සංග්‍රහය

11 එළුණ - "එළුණ" සඟරාව

12 නි.ම - නිශ්ශංක මල්ල (පොලොන්නරු යුගය)

13 ප.ත - පංච තන්ත්‍රය

14 ප.සු - පරමත්ථජෝතිකානාම සුත්තනිපාතට්ඨකථා

15 ප.ප.ජා - පන්සිය පනස් ජාතක පොත

16 බු.ස - බුත්සරණ

17 ලෝකෝපකාරය - ලෝ

18 වි.ලි - විචාර ලිපි

19 සි.සා - සිංහල සාහිත්‍ය කථා (4)

20 හි.දේ - හිතෝපදේශය

21 E . Z - Epigraphia Zeylanica

## හැඳින්වීම

සිංහල උම්මග්ග ජාතකයේ නිර්මාණාත්මක පසුබිම දෙස විමසිලිමත් වීමේ දී පෙනී යන්නේ මේ පොත ජාතකට්ඨ කථාවේ එන මහා උම්මග්ග ජාතකය සිංහල බසට පෙරළීමෙන් සකස් වී ඇති බව ය. ජාතකට්ඨ කථාව මුලින් ම සංගෘහිත වූයේ බුද්ධ වර්ෂ 953 දී පමණ මහානාම රජු කල ලක්දිවට පැමිණ මෙරට වැඩ විසූ බුද්ධඝෝෂ නම් හිමි නමක විසිනැ යි සැලකේ. සිංහල බෝධිවංශය, මිලින්ද ප්‍රශ්නය යන ග්‍රන්ථවල උම්මග්ග ජාතකයේ එන පුවත් ඇතුළත් බැවින් එය පාලි උම්මග්ග ජාතකය බලා ලියන්නට ඇතැයි සැලකේ. මේ කාලය බුද්ධඝෝෂ හිමි වැඩ සිටි කාලය වූ පස් වන සියවස බැවින් පාලි උම්මග්ග ජාතකය ඊට පෙර ලියවෙන්නට ඇතැයි ද විශ්වාස කෙරේ. තව ද පොලොන්නරු යුගයෙහි රජ පැමිණි පළමු වන පරාක්‍රමබාහු රජු කුමාර අවධියෙහි උම්මග්ග ජාතක පොත හදාළ බව මහාවංශයේ සඳහන් ය. එය පාලි උම්මග්ග ජාතකය වන්නට ඇතැයි සැලකේ. ධර්මප්‍රදීපිකාව, බුත්සරණ, දහම්සරණ යන පොත්වල ද උම්මග්ග ජාතකයේ එන විවිධ පුවත් ඇතුළත් වන බැවින් එම පුවත් මහා උම්මග්ග ජාතකයෙන් ගත් බව කියවේ. ඒ අනුව ජාතක පාලිය ඇසුරෙන් පැවත ආ ජාතක කථා පන්සිය පනහකට ආසන්න ප්‍රමාණයක් ඇතුළත් ජාතක කථා පොත කුරුණෑගල් යුගයෙහි රජ පැමිණි සිව් වන පරාක්‍රමබාහු රජු කල ( බු.ව 1848 දී පමණ ) සිංහලයට පරිවර්තනය කර ඇති බව ඉතිහාස ගත තොරතුරුවලින් හෙළි වේ. මෙය පරාක්‍රම නම් ඇමතියාගේ මෙහෙය වීමෙන් වීරසිංහ ප්‍රතිරාජයාගේ උත්සාහයෙන් කර ඇති බව ද එහි සඳහන් ය. මේ අනුව සෑම ජාතක කථාවකින් ම කියවෙන්නේ බුදුන්වහන්සේගේ බෝධි සත්ත්ව ආත්මවල ජාති උත්පත්ති පිළිබඳ එන කථා ප්‍රවෘත්ති ය. මේ පන්සිය පනස් ජාතක පොතට අමතර ව ජාතක අටුවා ගැටපදය හා ජාතක ගාථා සන්නය යන නමින් ද පොත් පත් ලිය වී ඇති

බව පෙනේ. ජාතක අටුවා ගැටපදය පොලොන්නරු යුගයේ ලියවී ඇති බවත් ජාතක කථා සන්නය නම් පොත පොලොන්නරු යුගයෙහි ම විසූ රාජ මුරාරි නම් අයෙකු විසින් ලියා ඇති බවත් සැලකේ. මෙ සේ ජාතක කථා මූලික වූ ජාතක සාහිත්‍යයක් බිහි වීමෙන් පසු කාලයේ දී විවිධ වූ ගද්‍ය පද්‍ය සාහිත්‍යයකට මග පෑදී ඇති බව පෙනී යයි.

බෝධි සත්ත්වයන්ගේ විවිධ උත්පත්ති කථා ප්‍රවෘත්ති ඇතුළත් වන මඛාදේව, කුස, සත්තුභත්ත, වෙස්සන්තර වැනි ජාතක කථා පදනම් කොට ගෙන පසු කාලයේ දී වෙනත් සාහිත්‍ය නිර්මාණ ද බිහි වී තිබේ. මඛාදේව ජාතකය ඇසුරෙන් මුව දෙව්දාවත, ශශ ජාතකයෙන් සසදාවත, කුස ජාතකයෙන් කව්සිළුමිණ, සත්තුභත්ත ජාතකයෙන් කාව්‍යශේඛරය, වෙස්සන්තර ජාතකයෙන් වෙස්සන්තර ජාතක කාව්‍යය යන කෘති බිහි වී ඇත. ජාතක පොත ඇසුරින් බිහි වූ ගද්‍ය පද්‍ය නිර්මාණ අතර මහා කාව්‍යය ග්‍රන්ථ ද ඇත. ඒ ගද්‍ය පද්‍ය නිර්මාණ අතුරෙන් සිංහල ගද්‍ය සාහිත්‍යයේ සම්භාව්‍ය කෘතියක් වන උම්මග්ග ජාතකය පිළිබඳ විශේෂ අධ්‍යයනයක් කිරීම මෙම නිබන්ධනයේ අරමුණ වේ. උම්මග්ග ජාතකය පිළිබඳ විවිධ විද්වතුන් විසින් විවිධ ලිපි ලේඛන ලියා ඇතත් මේ හා සම්බන්ධ ව පරිච්ඡේද වශයෙන් විවිධ වූ විෂය කරුණු මුල් කර ගෙන කළ අධ්‍යයනයක් නොමැති වීම විශාල වූ අඩු පාඩුවක් යැයි හැඟේ. එම නිසා සම්පූර්ණ උම්මග්ග ජාතකය ම පරීක්ෂණයට ලක් කර එම අඩු පාඩුව පුරවාලීම සඳහා ආදර්ශ ලෙස ගත හැකි කරුණු කිහිපයක් කෙරෙහි විශේෂ අවධානයක් මෙ මඟින් යොමු කර ඇත.

මෙය ඇසුරු කර පසු කාලයේ උමංදා කව වැනි පද්‍ය නිර්මාණ ද බිහි වී ඇති හෙයින් සාහිත්‍යමය වශයෙන් මේ කෘතිය තව දුරටත් අධ්‍යයනයට ලක් කිරීම සිංහල සාහිත්‍ය හදාරන සැමට යම් තරමකට හෝ ඵලදායී යැයි හැඟේ. ජාතක පොතේ ප්‍රචලිත වූ ජාතක කථා අතර උම්මග්ග ජාතකය විවිධත්වයක් දක්වන්නේ කථා ප්‍රවෘත්තිය නිර්මාණය කර ඇති ස්වභාවයෙනි. මෙය උම්මග්ග ජාතකයට සුවිශේෂිත කථා ක්‍රමයකි.

මෙහි මූලික කථා ප්‍රවෘත්තිය වන්නේ මියුලු නුවර වේදේහ රාජ්‍යය හා පඤ්චාල දේශය මුල් වූ පාලන තන්ත්‍රවල දේශ පාලන අරගලයක් බුද්ධිබල මහිමයෙන් සංසිඳුවීම සම්බන්ධ වූවකි. මියුලු නුවර පාලන කටයුතු සඳහා වේදේහ රජුට ගුරු උපදෙස් දෙන සේනක, පුක්කුස කාවින්ද, දේවින්ද යන පුරෝහිතයෝ සිව් දෙනෙක් වෙති. චූලනී බ්‍රහ්මදත්ත රජ පඤ්චාල දේශයේ පාලන කටයුතු  කේවට්ට නම් පුරෝහිතයාගේ උපදෙස් මත සිදු කරයි. සිය කේවට්ට පුරොහිතයාගේ උපදෙස් මත චූලනී බ්‍රහ්මදත්ත රජ චක්‍රවර්ති රාජ්‍යයකට හිමි බලය ලබා ගැනීම සඳහා මියුලු නුවර වේදේහ රාජ්‍යයේ බලය තමා සතු කර ගැනීමට උපක්‍රම යොදයි. වේදේහ රජුගේ හා උපදේශක මණ්ඩලයේ දුර්වල හා දූෂිත ක්‍රියා පිළවෙත් නිසා වේදේහ රාජ්‍යය නිරන්තරයෙන් ම සතුරාගේ ග්‍රහණයට ලඟා වේ. මෙහි දෙ රාජ්‍යයක් අතර ක්‍රමයෙන් වර්ධනය වන විශාල යුද්ධයක් එක ද ලේ බිඳකුදු නො සොල්වා ජයග්‍රහණය කරා ගෙන යාමට පසු කාලයේ දී වේදේහ රජුට පස් වන පණ්ඩිතයකු ලෙස සේවය කළ මහෞෂධ පණ්ඩිතයන් සමත් වී ඇති ආකාරය උම්මග්ග ජාතකයේ මූලික කතා පුවතේ එයි.

මෙම කතා පුවත අධ්‍යයනයකට ලක් කිරීමේ දී මතු වූ ගැටලු කිහිපයකි. ඉන් පළමු වැන්න නම් මෙකී කතා පුවතට කතුවරයා අනෙකුත් ජාතක කථාවල එන කථා ක්‍රමවලට වෙනස් වූ ආකාරයට රචනා උපක්‍රම භාවිතයට ගෙන ඇත්තේ කුමක් නිසා ද ? යන්න යි. දෙවැන්න නම් මෙ වැනි ප්‍රබල රාජ්‍ය දෙකක් විද්වත් පුරෝහිත මණ්ඩලයක උපදෙස් මත පාලනය වුවත් අවසානයේ විශාල සටනක් කරා ගෙන යාමට තරම් හේතු වූ දේශපාලන පසු බිම කුමක් ද ? යන්න ය. තෙ වැන්න නම් අනෙකුත් යස ඉසුරු බලය හා කුල මානය තිබුණත් ඒ සියල්ල පරදා සියලු අභියෝග ප්‍රඥාවෙන් ජය ගත හැකි ද? හා ඒ කෙසේ ද?

එ මගින් ඇති වන සමාජ සුබ සිද්ධිය කුමක් ද? යන මේවා ය. උම්මග්ග ජාතකයෙන් එකල වූ සමාජීය පසුබිම නිරූපණය කර ඇත්තේ ද? ඒ කෙසේ ද? යන්න සිව් වැනි පරච්ඡේදයෙන් විමසා බැලේ. ඒ ඇසුරෙන් උම්මග්ග ජාතකයේ සාහිත්‍යමය, දේශපාලනික හා සාමාජීය පසුබිම පිළිබඳ ව පුවත් මෙ මගින් විවරණය කෙරේ. උම්මග්ග ජාතකය අධ්‍යයනයට ලක් කිරීමේ අරමුණු හා එ මගින් එළඹිය හැකි නිගමනය සමාලෝචනය මගින් ඉදිරිපත් කර ඇත.

මෙහි දී මුළු උම්මග්ග ජාතක කථා ප්‍රවෘත්තිය ම ආවරණය වන පරිදි ඒ ඒ මාතෘකා යටතේ විස්තරාත්මක ව කරුණු ඉදිරිපත් කර ඇත්තේ බෙහෙවින් ම උම්මග්ග ජාතක කථා පොතේ ඇතුළත් පද වාක්‍ය නිදසුන් ලෙස ආදර්ශ කර ගැනීමෙනි. මේ සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මුද්‍රණය කරන ලද ගුණපාල සේනාධීරයන් විසින් සංස්කරණය කරන ලද උම්මග්ග ජාතක පොත පරිශීලනය කළෙමි.

ජාතක කථා පොතේ හමු වන අනෙකුත් ජාතක කථා මෙන් සෘජු ව කථාව ඉදිරිපත් කිරීමට තිබූ අවස්ථාව මඟ හරවා ඒ සඳහා පොකුරු කථා ක්‍රමයක් උම්මග්ග ජාතකයෙන් නිර්මාණය කළේ මේ කථා ප්‍රවෘත්තිය විශේෂතාවක් ඇති බැවිනි. එමෙන් ම සමාජ ව්‍යවහාරය ද මීට යොදා ගෙන තිබේ. සිංහල භාෂාව මනා ව හසුරුවමින් සරල හා වියත් බසක් යොදා ගෙන එකල සමාජයේ පවත්නා සමාජීය තොරතුරු ද හුවා දක්වමින් උම්මග්ග ජාතකය සාහිත්‍ය කෘතියක් ලෙස සකස් කොට තිබේ. එ පමණක් නොව අමාවතුර, ධර්ම ප්‍රදීපිකාව, බුත්සරණ, පූජාවලිය වැනි සාහිත්‍ය කෘතිවල දක්නට ලැබෙන කථා කීමේ ක්‍රමයට වෙනස් ව පාඨක රුචිය උපරිමය කරා ගෙන යාමට සුදුසු වූ කථා ශෛලියක් ද මේ සඳහා යොදා ගත් බව පැහැදිලි ය. මෙහි උම්මග්ග යන නාමය පවා

විවිධ විද්වතුන්ගේ විවිධ මත භේදයට තුඩු දී ඇත. එය ජාතකට්ඨ කථාවේ මහා උම්මග්ග ජාතකය ලෙසත් සිහංල බසට පෙරළීමෙන් උම්මග්ග ජාතකය ලෙසත් ඊට පසු එළු උමන්දාව ලෙසත් විවිධ කෘති බිහි වූයේ එක ම කතා පුවතක් හා එක ම අරමුණක් වටා ය. එසේ වුව ද උම්මග්ග යන නාමය කථා අරමුණ හා බලන කල විවිධ අරුත් ගන්වන බවක් පෙනෙයි. පොළොව යටින් දිය ගෙන යන මග උම්මග්ග නම් වේ. එමෙන් ම නිර්මාණශීලි වූ උමගට ද ඒ නම යෙදේ. කුම්මග්ග යනු වැරදි මාර්ගය යි. උම්මග්ග යන්න නිවැරදි මග යන අදහස දෙයි. මෙ නම් ඊට විවිධ අරුත් ගන්වා ඇත. මෙ වැනි යෙදුම් නිසා කුමන අර්ථය හා බැලූවත් මේ නම එකී කතා පුවතට බෙහෙවින් ම ගැළපෙන බවත් අර්ථාන්විත බවත් පැහැදිලි ය. අනෙකුත් ජාතක කතාවල දැක්වෙන්නාක් මෙන් කුස රජු මුල් වූ කතා පුවත කුස ජාතකය ලෙසත්, වෙස්සන්තර රජු මුල් වූ කතාව වෙස්සන්තර ජාතකය ලෙසත්, මඛාදේව රජු මුල් වූ කතාව මඛාදේව ජාතකය ලෙසත් නම් ගන්න ද මහෞෂධ පණ්ඩිතයන් මුල් වූ කතා පුවත මහෞෂධ ජාතකය යනුවෙන් නම් නො ගත්තේ මේ අරුත් කතා පුවතට මනා ව ගැළපෙන බැවින් යයි සැලකිය හැකි ය.

ආරම්භයේ දී ම උම්මග්ග ජාතකයේ වත්මන් කතා පුවත ගෙන හැර දැක්වේ. එය අනෙකුත් ජාතක කතාවල ද දක්නට ලැබෙන ආකාරයකි. මහෞෂධ කුමාරයාගේ උත්පත්ති කතා පුවතෙන් ඇරඹෙන්නේ එහි අතීත කාල කථා ප්‍රවෘත්තියයි. එය පරිබණ්ඩ කථා හා මහා උම්මග්ග ජාතකය (කථාව) වශයෙන් අදියර දෙකක් යටතේ ගලා යාමට ඉඩ දී ඇත. මෙය උම්මග්ග ජාතකයේ අඩක් පමණ ගිය පසු බෙදී ඇත්තේ මහෞෂධ පණ්ඩිතයන්ගේ ළමා වියෙන් මිදී තරුණ වයස එළඹීම ද ඊට මනා ව ගැළපී යන පරිද්දෙනි. එමෙන් ම කතා පුවත ආරම්භ වන මුල් කොටසින් විවිධ පැන මතු කිරීම හා ඊට පසු ඒවා විසඳීමෙන් ලද ප්‍රඥාවෙන් දෙ රාජ්‍ය අතර පවත්නා විශාල ගැටුමක් ජයග්‍රහණය කරා මෙහෙය වීමත්

පෙන්නුම් කර ඇත. මේ කතා පුවත කීමට කතුවරයා අනෙකුත් කථාවල එන පරිදි වත්මන් කතා පුවත වශයෙන් කතා පුවතක් ඉදිරිපත් නො කරයි. ඊට පසුගාමී වූ අතීත කථාව දීර්ඝ වශයෙන් ඉදිරිපත් කර ඇත. ඒ සඳහා පරිවාර කථා සමූහයක් යොදා ගෙන තිබීම මෙහි දක්නට ලැබෙන විශේෂතාවකි. (උම්මග්ග ජාතකයේ රචනා උපක්‍රම පිළිබඳ ජාතක පොතේ එන අනෙකුත් ජාතක කථාවල දක්නට නො ලැබෙන විශේෂිත කරුණු ගෙන හැර දක්වමින් එහි නිරූපිත පරිවාර කථා මූලික කතා පුවත වටා ගොනු කර ඇති ආකාරය නිබන්ධය සඳහා ඉදිරිපත් කරන ලද පළමු වන සම්මන්ත්‍රණ පත්‍රිකාව මඟින් ඉදිරිපත් කොට ඇත.)

තමන්ට බෙහෙවින් ම හිතැති අතිදක්ෂ නුවණැති තීක්ෂණ බුද්ධියක් ඇතැයි යයි සිතා ගුරු උපදේශකත්වයෙන් කටයුතු කර ගරු බුහුමන් ලබමින් උන් කී බස සැබෑ කොට ම ගන්නා බ්‍රාහ්මණ පුරෝහිතයන් නිසා වේදේහ රජු හා රාජ්‍යය අන්තරායය කරා පැමිණේ. මෙ වැනි බ්‍රාහ්මණ පණ්ඩිතවරුන් සිටිය දීත් එම රාජ්‍යයට වේදේහ රාජ්‍යයට විරුද්ධ ව විශාල යුද්ධයක් ඇති වීමට තරම් බිඳ වැටුණු දේශපාලන පසු බිමක් නිර්මාණය කිරීමට බල පෑ කාරණා කවරේ ද? යන්න විමසා බැලිය යුතු ය. මේ අනුව උත්තර පංචාල නම් විශාල රාජ්‍යය හා මියුලු නුවර වේදේහ නම් කුඩා රාජ්‍යය අතර ඇති වන බල අරගලය චක්‍රවර්ති බලය සඳහා ඇති වන්නකි. රාජ්‍යය පාලකයන් මෙ වැනි බල ලෝභිත්වයෙන් කටයුතු කරන්නේ රාජ්‍ය උපදේශක මණ්ඩලයේ මඟ පෙන්වීම නිසා ය. මේ දෙ රාජ්‍යය ගෙන යන දේශපාලනික අරගලය දුර දක්නා නුවණින් විමසා බලා කටයුතු නො කළ නිසා මෙ වැනි අන්තරායයකට පත් වූ බව පැහැදිලි ය.